

යාපනයට චාරිකාවක්

ඉසුරින්දි දම්සතිනි ද අල්විස්

යාපනයට
චාරිකාවක්

කතaa

ඉසුරින්දි දම්සතිනි ද අල්විස්

කතaaගේ වෙනත් කaති

1.මගේ යාළුවා

2.කඩුපුල් මල් කුමාරී

3. රිලා කතා

4.The Meeting

මහාමායා බාලිකා විදුහල මහනුවර

5 A

8/2/2025

ISBN – 978-624-208-699-6

පිදුම

මම මාගේ මේ කෘතිය මා හට අකුරු කළ සියලුම ගුරු භවතුන්ට පුද කරමි.

පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝටිටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණ ගත්කරණී** "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

යාපනයට ගිය චාරිකාව තාමත් එදා වගේ මතකයි. අපි උදේ 7ට ගෙදරින් පිටත්වුනා. කුරුණෑගලට යද්දි උදේ 8 විතර වුනා උදේ කෑම කුරුණෑගලින් අරන් අපි ආයෙත් ගමන ගියා. අනුරාධපුරයේට ළඟා වෙද්දි උදේ 12 විතර වුනා. වව්නියාවෙන් අපි දවල් කෑම අරන් ආයෙත් පිටත් වුනා. ඊට පසු අලිමංකඩ (පාර දෙපැත්තේම මුහුද තිබෙන තැනක්) හමුවුනා. එතන එහා පැත්තේ යුධ හමුදා කඳවුරක් තිබුනා. ඒ කඳවුරට තමා කොටින් බෝම්බ රැගත් බුල්ඩෝසරයක් එවලා තියෙන්නේ.

ඒ පිළිබඳ මම අසා දැනගත් කතාවකි මෙය,

එදා 1991 ජූලි මස 13 වන දින මධ්‍යම රාත්‍රියේ ලුතිනල් කර්නල් S.P. කරුණාරත්නගේ අණදීම යටතේ තිබූ ශ්‍රී ලංකා සිංහ රේජිමේන්තුවට අයත් අලිමංකඩ යුධ හමුදා කඳවුර (එලිෆන්ට්පාස් හමුදා කඳවුර) අවි අමොරාගත් ලේ පිපාසිත ත්‍රස්තවාදීන් පැමිණියා. යෝධ රකුසෙකුගේ වෙස්ගත් LTTE යුධ ටැංකිය බුල්ඩෝසරයක් ලෙස සකසා තිබුනි. තහඩු ගසා තුවක්කු සකස් කළ එම යුධ ටැංකිය කිලෝ දහස් ගාණක් බර පුපුරණ ද්‍රව්‍යවලින් පිරී තිබුනි. ත්‍රස්තවාදීන් මෙසේ පැමිණියේ අලිමංකඩ කඳවුර වනසා අත් පත් කරගැනීමටය. බෝම්බ දෙකක් දෑතට ගෙන බුල්ඩෝසරට පැනීමට හසලක ගාමිණී (කෝප්‍රල් ගාමිණී කුලරත්න) සිදුවීමට යන මහා විනාශය වලක්වා ගැනීමට

ඉදිරිපත් විය. ගාමිණී ත්‍රස්තවාදීන්ගේ බුල්ඩෝසරය ඉදිරියට දිවගියේ, කාගේවත් කීමක් නොආසාය. එදා ගාමිණී සමඟ කඳවුරේ බොහෝදෙනා "ගාමිණී එපා" යැයි හඬ නැඟුවද ඔහු එදා දිවගොස් බුල්ඩෝසරය පිපුරුවේය. ඔහු මහා වීරෙයකු වූයේ එලසිනි.

අපි ඔහුගේ ස්මාර්කය බලන්න ගියා එතන අර බුල්ඩෝසරය්ද තිබුනා. එතන පාසලක ගාමිණිගේ පිළිමයක්ද තිබුනා. කඩේකින් තේ බීලා අපි ආපසු ගමන ගියා.

ඊළඟට අපි ගියේ සංගුපිට්ටි පාලම බලන්න. එය යාපනය කලපුවේ පිහිටා ඇති කිලිනොච්චි දිස්ත්‍රික්කය හා කරෙයිතිව් යාපන දිස්ත්‍රික්කය යා කරන පාලමක් ලෙස තාත්තා මා හට විස්තර කර දුන්නා. එතන ඉඳන් ඉර බහිනවා බලන්න පුළුවන්. එතන හරිම ලස්සනයි. එතනට යද්දි රෑ 6.30 විතර වුනා.

ඊළඟට අපි හෝටලයකට ගියා. ඊළඟ දවසේ උදේ අපි කාලා නාගදීපයට යන්න සූදානම් වුනා. නාගදීපය පිහිටා තියෙන්නෙ නයිනතිව් දූපතේ. යාපනය නගරයේ සිට නාගදීපයට කිලෝමීටර් 35ක් වාහනයකින් ගිහින් ඉතුරු ටික ෆෙරියකින් ගියා. ෆෙරියට යන තැනට යන්න අපිට පැයක් විතර ගියා. ෆෙරිය එන්නත් පැය භාගයක් විතර ගියා. ළමයිනු දෙමව්පියනුත් උඩ තට්ටුවට නැග්ගා. උඩට නැගගන්න බැරි වුන අය පහළ තට්ටුවට ගියා.

කිලෝමීටර 2ක් පමණ ෆෙරියෙන් ගිහින් අපි නාගදීපයෙන් බැස්සා. නාගදීපය බුදුරාජාණන් වහන්සේගේ පා පහස ලැබූ පුණ්‍ය භූමියක්. චුල්ලෝදර මහෝදර යන නා රජුන් අතර මිණි පළඟ නිසා හට ගැනීමට ගිය යුද්ධය වැලැක්වීමට තමයි බුදුරජුන් නාගදීපයට පැමිණ ඇත්තේ. එතන එහා පැත්තේ කෝවිලක් තිබුනා. වෙලා මදි නිසා අපි එතනට ගියේ නැහැ.



ඊට පස්සෙ අපි ආපසු හෝටලයකට ගිහින් දවල් කෑම අරන් යාපනය මහජන පුස්තකාලය බලන්න ගියා. එතන පොත් ගොඩක් තිබුණා ඒ වුනත් අපට ඒවා තහනම් එක දවසක් මේ පුස්තකාලයට ගිනි තියලා තියෙනවා කියලා අම්මා කිව්වා මට මතකයි.

අපි ආපසු හෝටලයට ගිහින් සවස පේදුරුතුඩුව බලන්න ගියා (ශ්‍රී ලංකාවේ උතුරු කෙලවර). එතනින් සිතිජය ලස්සනට පේනවා. ආපසු එනකොට අපි ප්‍රභාකරන් නම් කුරිරු ත්‍රස්ථවාදියා, පුංචි කාලයේ හිටපු තැන බලන්න ගියා. එතන තිබුනේ ඉඩමක් විතරයි. ඊට පස්සේ අපි යන පාරෙ අයිස් ක්‍රීම් කඩයක් තිබුනා. අපි එතනට ගිහින් අයිස්ක්‍රීම් කාලා, අත්තම්මට රටකජු බිස්කට් අරන් ආපසු හෝටලයට ගියා. රෑ කෑම කාලා නින්දට ගියා.

ඊළඟ දවසේ අපි උදේම නැගිටලා අපි උදේ කෑම කන්න ගියා. මේ පළාතේ කෑම ගොඩක් සැරයි. ඊට පස්සෙ උදේ 8.00 ට විතර ලෑස්ති වෙලා 9.00ට විතර හෝටලයෙන් පිටත් වුනා.

ඊලගට අපි දඹකොළපටුන බලන්න ගියා. එතනට තමයි සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධියත් සමග ගොඩ බැහැලා තියෙන්නේ . එතන පන්සලකුත් ඉදිකරලා තිබුණා. දේවානම්පියතිස්ස රජු වතුරට බැහැලා තමයි ශ්‍රී මහා බෝධිය රැගත් නැව එනකම් බලා ඉදලා තියෙන්නේ. එතන මුහුද හරිම නිස්කලංකයි චුටි චුටි රැලි එන්නේ එතන පොඩි පොකුණක් තියෙනවා එතන සංඝමිත්තා තෙරණිය ආපු විදිහ ගහලා තියෙනවා .

එතන ආරක්ෂා කරන්නේ ශ්‍රී ලංකා නාවික හමුදාව (Sri Lankan Navy)ය. එතන කඩයක් තිබෙනවා එතනින් තේ බීලා ආපසු මන්නාරම බලා පිටත් වුනා.

අපි මන්නාරමට යන්න පැයක් විතර ගියා. ඒ යද්දි අපි මඩු පල්ලිය දැක්කා. ඒක ගොඩක් ප්‍රසිද්ධ පල්ලියක්. අපි ගියේ බයෝබැඩ් ගස බලන්න. ඒක ශ්‍රී ලංකාවේ ලොකුම ගස හා එය ලෝකයේ ලොකුම ගස් අතරින් එකකි. අරාබි වෙලෙන්දෙක් විසින් ශ්‍රී ලංකාවට බයෝබැබ් ගස (අලි ගස) ගෙන එන්නට ඇතැයි විශ්වාස කරනවා. 2003 වසරේ කරන ලද සමීක්ෂණයකට අනුව මෙරට බයෝබැබ් ගස් 4ක් පමණ තිබෙන අතර, මින් පලිමුනේ පිහිටා තිබෙන බයෝබැබ් ගස වර්ශ 741 ක් පමන පැරණියැයි විශ්වාස කරනවා. මෙය පුරාවිද්‍යා ස්මාර්කයක් වශයෙන් නම් කර තිබුණා.



ඊළඟට අපි පොඩි දෙයක් කාලා ගමන ගියා. ඊටපස්සෙ අපි රෑ කෑම කෑවේ රෑ 8.30ට විතර. ඊළඟට අපි දඹුල්ල හරහා ගෙදර ගියා. ගෙදරට ළඟාවෙදි රෑ 12ක් පසුවෙලා දැනුමත්, සතුටත් නොඅඩුව ලැබූ චාරිකාවක නිමා කරමින් අපි නින්දට ගියා.

පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔජනැංපීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණිය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්

ISBN – 978-624-208-699-6